# ලෝක මහා සංග්‍රාම හා සම්මුතීන්




T.K Chinthaka Thalpawila
BA(sp), PGDA, MSc, PGDE

# හැඳින්වීම

විසිවන සියවසේ ප්‍රථම භාගයේ දී සමස්ත ලෝකයට ම බලපෑ මහා සංග්‍රාම දෙකක් ඇති විය. මෙම සංග්‍රාම දෙක ම යුරෝපයෙන් ආරම්භ වී පසුව සෙසු මහාද්වීප කරා පැතුරුණි. ලොව බලවත් රටවල් රැසක් මෙම යුද්ධවලට සම්බන්ධ වී සමස්ත ලෝකයට බලපෑම් ඇති කළ නිසා ඒවා ලෝක මහා සංග්‍රාම ලෙස හඳුන්වනු ලැබේ. මෙම යුද්ධවලින් සිදු වූ ව්‍යසනය නිසා ම නැවත ලෝක මහා සංග්‍රාමයක් ඇතිවීම වළක්වා ගැනීම පිණිස ලෝක නායකයෝ විවිධ සම්මුති ඇති කර ගත්හ.

# 8.1 පළමුවන ලෝක මහා සංග්‍රාමය

1914 - 1918 කාලයේ ලොව පුරා පැතිරී ගිය යුද්ධය පළමු වන ලෝක මහා සංග්‍රාමය ලෙස හැඳින් වේ



# පළමුවන ලෝක මහා සංග්‍රාමයට බලපෑ හේතු

01 ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ දී, ප්‍රංශය හා ජර්මනිය සතුරන් බවට පත් වීම



ඔටෝ වොන් බිස්මාර්ක්

# 02 ජර්මන් අධිරාජයා වූ දෙවන විලියම්ගේ ක්‍රියා කලාපය



දෙවන විලියම් අධිරාජායයා

3 යටත් විජිත සඳහා වූ තරගය

4 අවි තරගය හා ජාතිවාදය වර්ධනය වීම

5 ප්‍රංශය යුරෝපය තුළ තනි කිරීමට බිස්මාර්ක් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය

6 ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරා මරා දැමීම




ප්‍රාන්ස් පර්ඩිනන්ඩ් හා ඔහුගේ බිරිඳ ඝාතනය කිරීම දක්වෙන සිතුවමක්

# පළමු වන ලෝක යුද්ධයට සම්බන්ධ වූ රටවල්

| මිත්‍ර පිලේ රටවල් | මධ්‍යම බලවතුන්ගේ රටවල් |
|---|---|
| ප්‍රංශය, මහා බ්‍රිතාන්‍ය, රුසියාව, ඇමරිකා එක්සත් ජනපදය | ජර්මනිය, ඔස්ට්‍රියාව, ඉතාලිය, තුර්කිය, බල්ගේරියාව, හංගේරියාව |

# පළමු වන ලෝක සංග්‍රාමයේ ව්‍යාප්තිය




## පළමු ලෝක සංග්‍රාම අවධියේ යුරෝපය


**මධ්‍ය බලවතුන්**
ජර්මනිය
ඔස්ට්‍රෝ-හන්ගේරියාව
බල්ගේරියාව
තුර්කිය

**මිත්‍ර බලවතුන්**
බ්‍රිතාන්‍ය
ප්‍රංශය
රුසියාව
ඉතාලිය

සර්බියාව
රුමේනියාව
ග්‍රීසිය

## ඇමරිකා එක්සත් ජනපදය යුද්ධයට සම්බන්ධ වීම

ඇමරිකාව සතු වූ ලුසිටානියා නම් මගී නැව ජර්මන් සබ්මැරිනයක් මගින් ගිල්වා දැමීම නිසා ඇමරිකා එක්සත් ජනපදය යුද්ධයට අවතිර්ණ විය



## පළමු ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල

01 මධ්‍යම බලවතුන් පරාජයට පත් වී මිත්‍ර බලවතුන් ජය ගැනීම යුද්ධයේ වැදගත් ම ප්‍රතිඵලය යි

02 ගිනි අවි භාවිත කිරීම හේතුවෙන් අතිවිශාල ජීවිත හා දේපල හානියක් සිදු වූ අතර ලක්ෂ සංඛ්‍යාත ජන සංඛ්‍යාවක් ආබාධිත තත්ත්වයට පත්ව ඇත

03 වර්සෙල්ස් ගිවිසුම ඇති වීම

## වර්සෙල්ස් ගිවිසුමෙන් ජර්මනියට දැඩි දඬුවම් පැමිණි වූ ආකාරය

01 ජයග්‍රාහී රටවලට විශාල වන්දි මුදලක් ගෙවීමට ජර්මනියට සිදු වීම.

02 හමුදා තබා ගැනීම හා අවි ආයුධ නිෂ්පාදනය සඳහා ජර්මනියට සීමා පැමිණවීම.

03 ජර්මනිය ප්‍රංශයෙන් අල්ලාගෙන තිබූ ඇල්සාස් හා ලොරේන් ප්‍රදේශ යළි ප්‍රංශයට පවරා දීම.

04 යුරෝපයෙන් පිටත ජර්මනිය සතු වූ යටත් විජිත ජයග්‍රාහී ජාතීන් අතර බෙදා ගැනීම

## 8.2 ජාතීන්ගේ සංගමය

1919 පැවැත්වූ, පැරිස් සාම සාකච්ඡාවල දී, ලෝක සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම හා නැවත මෙබඳු යුද්ධයක් ඇති වීම වළක්වා ගැනීම පිණිස ජාත්‍යන්තර සංවිධානයක් පිහිටුවා ගැනීමේ අරමුණ මත 1920. 01.10 දින ජාතීන්ගේ සංගමය බිහි විය.

## ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ අරමුණු

01 රටවල් අතර ඇතිවන අර්බුද සාමකාමීව විසඳීම

02 අනාගතයේ ලෝක යුද්ධ ඇතිවීම වැලැක්වීම

03 ජාත්‍යන්තර අවබෝධය හා සහයෝගය ගොඩනැගීම

04 කුඩා රාජ්‍යයන්ගේ නිදහස හා ස්වාධීනත්වය ආරක්ෂා කිරීම

05 විශ්ව සාමූහිකත්වය මගින් ලෝක සාමය සුරක්ෂිත කිරීම

01 ස්වීඩනය හා පින්ලන්තය, ජර්මනිය හා පෝලන්තය, ග්‍රීසිය හා බල්ගේරියාව, ඉරානය හා තුර්කිය වැනි රටවල් අතර ඇති වූ යුද ගැටුම් වැලැක්වීම

02 සරණාගතයන් පුනරුත්ථාපනය සඳහා මැදිහත්ව කටයුතු කිරීම්

03 පළමු වන ලෝක යුද්ධයෙන් පසුව ජාතීන්ගේ සංගමයේ භාරකාරත්වයට පත් කොට තිබූ යටත් විජිත පිළිබඳ අධීක්ෂණ කටයුතු සාර්ථකව සිදු කිරීම

04 නීති විරෝධී වහල් වෙළෙඳාම හා මත්ද්‍රව්‍ය වෙළෙඳාම අඩපණ කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

# ජාතින්ගේ සංගමය අසාර්ථක වීමට හේතු

01 ඇමරිකා එක්සත් ජනපදය ජාතීන්ගේ සංගමයේ සාමාජිකත්වය ලබා නොගැනීම

02 තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා සාමාජිකයන් පොළඹවා ගැනීමේ දී සංගමය අසාර්ථක විම

03 සාමාජිකත්වය ලබා සිටි බලවත් රටවල් අතර එකමුතුකමක් නො තිබීම

04 ලෝක සාමය කඩ වූ ඇතැම් අවස්ථාවල දී එම රටවලට විරුද්ධව කටයුතු කිරිමට සංගමය අපොහොසත්

05 ජපානය මැංචූරියාව ආක්‍රමණය කළ අවස්ථාවේ ජපානයට විරුද්ධව කිසි දු ක්‍රියාමාර්ගයක් නො ගැනීම

## ක්‍රියාකාරකම

පළමු ලෝක යුද්ධයට සම්බන්ධ වූ රටවල් සිතියමක ලකුණු කරන්න.

# 8.3 දෙවන ලෝක මහා සංග්‍රාමය

1939 සැප්තැම්බර් මස සිට 1945 අගෝස්තු දක්වා පුරා වසර හයක පමණ කාලයක් ලොව පුරා පැවැති බිහිසුණු සංග්‍රාමය දෙවන ලෝක මහා සංග්‍රාමය ලෙස හැඳින්වේ.



# දෙවන ලෝක සංග්‍රාමයට තුඩු දුන් හේතු

## 01. ජර්මනියේ හිට්ලර් බලවත්වීම හා ඔහුගේ ක්‍රියා කලාපය







ඇඩොල්ෆ් හිට්ලර්





02. ඉතාලියේ මුසෝලනීගේ ක්‍රියාකලාපය

03. ජපානයේ ක්‍රියාකලාපය


04. ජාතීන්ගේ සංගමයේ දුර්වලතා

# දෙවන ලෝක යුද්ධයේ පාර්ශ්වකරුවන්





ජර්මන් ප්‍රහාරක සබ්මැරිනයක



යුදෙව්වන් හා යුද්ධයේ දී අල්ලා ගත් සිරකරුවන් විනාශ කිරීමට හිට්ලර් විසින් යොද ගත් ගෑස් උදුන්

# දෙවන ලෝක යුද්ධයේ ව්‍යාප්තිය

01 ජර්මනියේ හිට්ලර් පෝලන්තය ආක්‍රමණය කිරීමත් සමග දෙවන ලෝක සංග්‍රාමය ආරම්භ විය




බ්‍රිතාන්‍ය ප්‍රහාරක ගුවන් යානා



වින්සන්ට් චර්චිල්

# 02 ඇමරිකා එක්සත් ජනපදය යුද්ධයට සම්බන්ධ වීම




පර්ල් වරායට පහර දීම

03 ජර්මනිය රුසියාව ආක්‍රමණය කිරීම

04 ජර්මනිය යටත් වීම

05 ජපානය යටත් වීම





හිරෝෂිමාවට හෙලන ලද පරමානු බෝම්බය



හිරෝෂිමා විනාශය

# දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල

අක්ෂ පිල පරාජයට පත් වීම

මිනිස් ජීවිත මිලියන 50කට වඩා විනාශ වීම

යුදෙව්වන් මිලියන ගණනක් නාසි හමුදාව විසින් වද කඳවුරුවලට ගාල් කර මරා දමන ලදී

පරමාණු බෝම්බය යුධ අවියක් ලෙස භාවිත කිරීම

ලෝක බලවතුන් වශයෙන් සිටි ප්‍රංශයට හා බ්‍රිතාන්‍යයට එම ස්ථාන අහිමි වී ගිය අතර ඔවුන්ගේ අධිරාජ්‍යවාදී සංකල්ප බිඳ වැටුණි.

විනාශයට පත් වූ යුරෝපයේ පරාජිත රටවල් නගා සිටුවීම සඳහා ඇමරිකා එක්සත් ජනපදය ඉදිරිපත් විය

ඇමරිකා එක්සත් ජනපදය හා සෝවියට් රුසියාව ලෝක බලවතුන් ලෙස නැගී සිටිම

# 8.4 එක්සත් ජාතීන්ගේ සංවිධානය



ක්‍රි. ව. 1943 දෙසැම්බර් මාසයේ ටෙහෙරාන් නුවරදී

* ඇමරිකා එක්සත් ජනපද ජනාධිපති ෆ්‍රෑන්ක්ලින් රූස්වෙල්ට්
* බ්‍රිතාන්‍ය අගමැති වින්සන්ට් චර්චිල්
* රුසියානු නායක ජෝසප් ස්ටාලින්

සාමය පවත්වාගෙන යාම සඳහා ජගත් සංවිධානයක් පිහිටුවිය යුතු ය, යන යෝජනාව පිළිගත්හ

# එක්සත් ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ අරමුණු

- ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම
- ජාතින් අතර මිත්‍ර සම්බන්ධතා වර්ධනය කිරීම්
- මානව අයිතිවාසිකම් හා මුලික නිදහස තහවුරු කිරීමෙහිල ජාත්‍යන්තර සහයෝගය සාක්ෂාත් කර ගැනීම

# එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය

1. මහා මණ්ඩලය
2. ආරක්ෂක මණ්ඩලය
3. ආර්ථික හා සමාජ කටයුතු මණ්ඩලය
4. භාරකාර මණ්ඩලය
5. ජාත්‍යන්තර අධිකරණය
6. මහලේකම් කාර්යාලය





ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයන් ඡන්දය භාවිත කරන අවස්ථාවක්

ECOSOC




ආර්ථික හා සමාජ කටයුතු මණ්ඩලයේ රැස්වීම් අවස්ථාවක්




හේග් නගරයේ පිහිටි අන්තර්ජාතික අධිකරණය

# එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය රැකීම සඳහා ගත් ප්‍රයත්න

- සුවස් අර්බුධය
- ගල්ෆ් අර්බුධය
- කියුබානු මිසයිල අර්බුධය

## වර්තමාන ලෝක සාමය රැකීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගත හැකි ක්‍රියාමාර්ග

- ආර්ථික සම්බාධක පැනවීම
- න්‍යෂ්ටික අවි තැනීම සීමා කිරීම හා පාලනය කිරීම සඳහා කටයුතු කිරීම
- සාම සාධක හමුදාව යෙදවීම